## 5 ඒකකය - අම්ල හා භස්ම(1)

✓ **පෙළ පොත හෝ වෙනත් සුදුසු ඉගෙනුම් සම්පත් පරිශීලනයෙන් පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.** අවශ්‍ය තැන්හි දී වැඩිහිටියෙකුගේ සහය ලබා ගන්න

### ක්‍රියාකාරකම 5.1

**අවශ්‍ය ද්‍රව්‍ය :-** පොකුරු වදමල් තැම්බූ ජලය, දෙහි යුෂ, විනාකිරි, සබන් දියර, හුනු දියර, අළු දිය කළ ජලය, ලුණු ද්‍රාවණය, ජලය



5.2 රූපය ▲ පොකුරු වද පුෂ්පයක්

**ක්‍රමය :-**

- පොකුරු වද මල් ජලයේ තම්බා ද්‍රාවණයක් පිළියෙල කරන්න.
- පහත වගුවේ සඳහන් ජලීය ද්‍රාවණවල සමාන පරිමා (2 ml පමණ) වෙන වෙනම පරීක්ෂා නළවලට දමන්න.
- වදමල් යුෂ තම්බා සාදගත් ද්‍රාවණයේ බිංදු දෙක බැගින් එම පරීක්ෂා නළවලට එකතුකර හොඳින් මිශ්‍ර කරන්න.
- ලැබෙන නිරීක්ෂණ පහත ආකාර වගුවක සටහන් කරන්න.

5.1 වගුව ▼

| ජලීය ද්‍රාවණය | අම්ලද භස්ම ද උදාසීන ද යන බව | වදමල් යුෂ සමඟ ලබා දෙන වර්ණය |
|---|---|---|
| දෙහි යුෂ | අම්ල | |
| විනාකිරි | අම්ල | |
| සබන් දියරය | භස්ම | |
| හුනු දියරය | භස්ම | |
| අළු මිශ්‍ර කරන ලද ජලය | භස්ම | |
| ලුණු ද්‍රාවණය | උදාසීන | |
| ජලය | උදාසීන | |

පරිසරයේ ඇති ද්‍රව්‍යවලින් දර්ශක කිහිපයක් සාද ගන්න. එම දර්ශකවලින් බිංදු කිහිපය බැගින් වගුවේ දක්වෙන ද්‍රව/ද්‍රාවණවලට එකතු කරන්න. නිරීක්ෂණය වන වර්ණය වගුවේ අදළ තැන සටහන් කරන්න.

5.2 වගුව ▼

| ද්‍රව/ද්‍රාවණ | සාදා ගත් දර්ශක | | | |
|---|---|---|---|---|
| | කහ තැම්බූ ජලය | | | |
| දෙහි යුෂ | | | | |
| විනාකිරි | | | | |
| හුනු දියරය | | | | |
| සබන් දියර | | | | |
| ෂැම්පු ද්‍රාවණයක් | | | | |
| සෝඩා වතුර | | | | |
| අවර්ණ සිසිල් බීම | | | | |
| ලුණු ද්‍රාවණය | | | | |
| සීනි ද්‍රාවණය | | | | |
| ග්ලූකෝස් ද්‍රාවණය | | | | |
| භූමිතෙල් | | | | |